**පළාත් මහාමාර්ග ව්‍යාපෘතිය (නැගෙනහිර පළාත) - 2014**

-----------------------------------------------------------

පළාත් මහාමාර්ග ව්‍යාපෘතිය (නැගෙනහිර පළාත) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09 (ආ) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

මූල්‍ය ගිවිසුමට අනුව පළාත් මහාමාර්ග ව්‍යාපෘතියේ නැගෙනහිර පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර වර්තමානයේ පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. වැඩි දියුණු කළ මාර්ග යටිතල පහසුකම් අඛණ්ඩ කළමනාකරණය තුළින් නැගෙනහිර පළාතේ සමාජ- ආර්ථික මධ්‍යස්ථාන පරිශීලනය පුළුල් කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිලි අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 2,000 කට සමාන එජඩොලර් මිලියන 20 ක මුළු වටිනාකම ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 ආරම්භ කළ අතර 2015 මාර්තු 31 අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය ඇති කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4. විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද

ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

------------------------

මල්වත්ත- සූරිප්පොඩෙයි මාර්ගයේ පාලම් දෙකක් ඉදිකිරීම සඳහා යොදාගත් ජේට වෙනුවෙන් ගෙවීම් සිදු කිරීමේදී ව්‍යාපෘතිය හා කොන්ත්‍රාත්කරු අතර ඇතිවූ ආරාවුල මත විනිශ්චයකරු විසින් සිදු කළ නියමය අනුව, ව්‍යාපෘතිය විසින් රු. 40,042,967 ක් ගෙවිය යුතුව තිබුණි. කෙසේ වෙතත් මෙම අසම්භාව්‍ය වගකීම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමේ මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | අයවැය ඇස්තමේන්තු වේ සිදුකළ ප්‍රතිපාදන | උපයෝජනය කළ වටිනාකම | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ස. | 20 | 2,000 | 450.00 | 3.37 | 438.20 | 17.87 | 2,323.20 |
| ශ්‍රී.ලං.ර | - | - | 32.50 | 0.02 | 12.30 | 0.02 | 10.04 |
| එකතුව | 20 | 2,000 | 482.50 | 3.39 | 450.50 | 17.89 | 2,333.24 |

## 3.2 භෞතික ප්‍රගතිය

පැකේජ 06 ක් යටතේ නැගෙනහිර පළාතේ, පළාත් මාර්ග 11 ක දුර කිලෝමීටර 56.35 ක එකතුවක් පුනරුත්ථාපනය කිරීමට ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පිරිනමා තිබුණු අතර ඉන් පැකේජ 05 ක් යටතේ පළාත් මාර්ග 10 ක දුර කිලෝමීටර 56.15 ක් සම්පූර්ණ කර 2014 දෙසැම්බර් 31 වන විට ව්‍යාපෘතිය විසින් භාරගෙන තිබුණි. 2014 නොවැම්බර් 19 දිනැති ලිපිය අනුව, කාලය නොමැතිවීම හේතුවෙන් ඊපී-08 දරන පැකේජය යටතේ මාර්ග පුනරුත්ථාපන වැඩ අත්හිටුවීමට ලෝක බැංකුව දන්වා තිබුණි. කෙසේ වෙතත් රු. 143,442,060 ක ඇස්තමේන්තුගත මුළු පිරිවැයකට ඊපී-08 දරන පැකේජය යටතේ මාර්ග 03 ක් පුනරුත්ථාපනයට 2014 නොවැම්බර් 12 දින ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) පැකේජ 05 යටතේ පළාත් මාර්ග 10ක් පුනරුත්ථාපනයේදී මාර්ග සලකුණු කිරීම, දැන්වීම්පුවරු, කාණු උඩින් කොන්ක්‍රීට් ආවරණ සවිකිරීම සහ විදුලි ආලෝක කණු පින්තාරු කිරීම ආදී මාර්ග ආරක්ෂා හා සමාජ ආරක්ෂණ අවශ්‍යතාවයන් කොන්ත්‍රාත්කරුවන් විසින් සම්පූර්ණ කර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද රු. 15,000,000 ක ඇස්තමේන්තු පිරිවැයක් වූ නින්දවූර් මාර්ගයේ මීටර් 600 ක පුනරුත්ථාපන වැඩ සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත් සියළු මාර්ගවල සම්පූර්ණ පුනරුත්ථාපන වැඩ සෑහීමකට පත්විය හැකි ආකාරයෙන් අවසන් කර ඇතිබව ඉංජිනේරුවරු සහතික කර තිබුණි.

(ආ) විදේශීය ආයතනය සමඟ ඇතිකර ගත් උපදේශක ගිවිසුමේ පොදු කොන්දේසි 3.8 ජේදය අනුව, උපදේශන කොන්ත්‍රාත්තුව අවසන් වූ 2014 නොවැම්බර් 30 දින ඉදිරිපත් කළයුතු වාර්තාව 2015 මැයි 31 වන විටත් උපදේශක විසින් ඉදිරිපත් කර නොතිබුණි.